**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2008/2009**

**අපරාධ නීතිය - LWU 2312**

**කාලය පැය 03 යි.**

---

දිනය - 2009 මාර්තු 23 වන දින    වේලාව - පෙ.ව.09.30- ප.ව.12.30 දක්වා

---

ප්‍රශ්න **පහකට (5)** පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. "..... නිසැකයෙන්ම, වඩාත් පැහැදිලිව පෙනෙන සදෝෂී මානසිකත්වය වන්නේ හානිකර ප්‍රතිඵලය ඇති කිරීම පිණිස වූ චේතනාවයි. නමුත් හානිකර ප්‍රතිඵලයක් ඇතිකිරීමට හේතු වන බවට වටහාගත් හා පිළිගත නොහැකි අවදානම දැන දැනම නොසලකා හැරීම හෝ එවැනි අවදානමක් සම්බන්ධයෙන් ඕනෑකමින්ම සිත යොමු නොකර සිටීමද සාවද්‍ය බව නිරායාසයෙන්ම පිළිගත යුතුය...."

Per Lord Binham J in ***R vs G and another*** [2003] UKHL 50.

සාවද්‍ය මනස යන සංකල්පය, ඉහත දැක්වෙන ප්‍රකාශය සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

02. නිමල්, තමා සහ අසල්වැසි චතුරි අතර පැවති ප්‍රේම සබඳතාව බිඳ වැටීම පිළිබඳව සාලිය සම්බන්ධ බව විශ්වාස කිරීම නිසා සාලිය සමග අමනාපයෙන් පසු විය. දිනක් නිමල් සේවය නිමවී ආපසු එන අතරමග දී සාලිය ව දුටුවේය. නිමල් එක්වරම සාලිය වෙත පැන මිට මොලවා හැකි තරම් වැරෙන් ඔහුගේ මුහුණට පහර දුනි. සාලිය බිම ඇද වැටුණු අතර ඔහුගේ හිස තදින් ගලක වැදීම නිසා සිහි මූර්ජා තත්වයට පත් විය. සාලිය මිය ගිය බව විශ්වාස කිරීමෙන් කලබලයට හා බියට පත් නිමල්, සාලියගේ සිහිසුන් සිරුර ඈතින් පිහිටි පටුමගකට ඇදගෙන ගොස් කැලි කසලවලින් වසා දැමුවේය. සිහිසුන්ව එතැනම සිටි සාලිය කසල ගෙන යන ට්‍රක් රථයකට හසුවීම හේතුවෙන් පසුදින උදෑසන මරණයට පත් විය.

නිමල්ගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

03. ආර්ථික දුෂ්කරතාවන්ගෙන් පෙළුණු පාලිත තමා සේවය කරන ස්ථානයේ වැටුප් ගෙවීම පිණිස ගෙනෙන මුදල් කොල්ලකෑමට තීරණය කළේය. ඔහු තම සැලසුම ක්‍රියාත්මක කිරීම පිණිස පතරොම් තුවක්කුවක් මිලදී ගත් අතර මෝටර් සයිකලයක් ද ඉල්ලා ගත්තේය. පාලිත මෝටර් සයිකලයෙන් කාර්යාලය වෙත ගොස්, වැටුප් මුදල් සහිත සූට්කේසය රැගෙන එන ආරක්ෂක නිලධාරියා වන පෙරේරා එන තෙක් නැවති සිටියේය. පෙරේරා සාමාන්‍යයෙන් පිස්තෝලයකින් සන්නද්ධව සිටී. පෙරේරා ගොඩනැගිල්ලට ඇතුල්වීමට යනවාත් සමගම පාලිත ක්ෂණයකින් ඔහු පසුපස දුවගොස් ඔහුගේ හිස පිටුපසට පතරොම් තුවක්කුවෙන් පහර දුන්නේ ය. මුදල් බෑගය රැගෙන පලාගොස් මෝටර් සයිකලයට නැගීමට පාලිතට හැකි විය.

හිසට වැදුන පහර නිසා ක්ලාන්ත ස්වභාවයට පත්ව සිටි පෙරේරා "ඔහොම නැවතියන් හොරා, නැතිනම් මම වෙඩි තියනවා !" යනුවෙන් කෑ ගැසීය. පාලිත මෝටර් සයිකලය පණ ගන්වා නැගී ගියේය. ඒ සමගම පෙරේරා පාලිතගේ උරහිසට වෙඩි තැබුවේය. වේදනාවෙන් පෙළෙමින් හා පෙරේරා නැවත වෙඩි තබතැයි යන බියෙන් පාලිත මෝටර් සයිකලය ආපසු හරවා කෙළින්ම පෙරේරා වෙත එය පැදවීය.

මෝටර් සයිකලය පෙරේරාගේ ඇඟෙහි හැපුණ අතර ඔහු විසිවී ගොස් හිස බිම වැදුණි. ඉන් ඔහුගේ හිස් කබල බිඳී ගියේය.

පාලිත හා පෙරේරාගේ යම්කිසි සාපරාධී වගකීමක් තිබේ නම් සාකච්ඡා කරන්න.

04. රීටා තමාගේ ඉතා හිතවත් මිතුරියකවූ රමණීට කථා කොට, එදින සවස් භාගයේ තමා යම් අයකු මුණ ගැසීමට නියමිත බැවින් එම පුද්ගලයා ප්‍රසාදයට පත් කිරීම සඳහා එහි දී පැළඳීම පිණිස තමාට රමණීගේ රන් මාලය ඉල්ලා ගැනීමට හැකිදැයි ඇසුවාය.

රීටා තම මාලය නැති කරතැයි සිතීම නිසා රමණී ඊට පැකිළුණාය. හමුවීම අවසානයේ එදිනනම සවස ආපසු දීමට පොරොන්දු වීමෙන් මාලය තමා වෙත දීමට රමණීව පොළඹවා ගැනීමට රීටා සමත් වූවා ය.
බලාපොරොත්තු වූවාට වඩා කලින් හමුවීම අවසන් විය. මුදල් අඩුපාඩු පැවති බැවින්, ආපසු ගෙදර එන අතරමග දී මාලය උකස් කිරීමටත් තමාගේ වැටුප් ලැබුණ පසු එය උකසින් බේරාගෙන රමණී වෙත ආපසු දීමටත් රීටා තීරණය කළා ය.

රීටාගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

05. මසුන් මරන්නකු වූ ඇන්තනී වැඩි කාලයක් මුහුදෙහි ගත කළේය. ඔහු මත්පැනට ඇබ්බැහි වී සිටිය නමුත් පසුගිය මාස 6 ක කාලය තුළ මත්පැන් බීමෙන් වැළකී සිටියේය. ඔහුගේ බීමත්කම නිසාම ඔහු තම බිරිඳ සමග නිතර අඬ දබර ඇති කර ගනී. දිනක් ඔහු මසුන් ඇල්ලීමට ගොස් වෙනදාට වඩා වේලාසනින් ආපසු පැමිණෙන අතර, තම බිරිඳ වූ මැටිල්ඩා තමාගේ මිතුරකු වූ සිරා සමග යහනෙහි සිටිනු දකියි. මෙයින් මහත් සේ කුපිත වූ ඇන්තනී මුළු තැන්ගෙයට ගොස් මත්පැන් වීදුරු දෙකක් පානය කර පිහියක් ද රැගෙන පැමිණෙයි. අනතුරුව ඇති වූ දබරයේ දී 'කමකට නැති බේබද්දා !' යනුවෙන් මැටිල්ඩා ඔහුට පරිභව කරයි. මෙයින් අධික ක්‍රෝධයටත් අවමානයටත් පත් ඇන්තනී සිරාට දහ හතර වතාවක් පිහියෙන් අනියි. රෝහලට ගෙන යන අතරමඟ දී සිරා මිය යයි.

මිනී මැරුම සම්බන්ධයෙන් ඇන්තනීට චෝදනා නැඟී ඇත.

ඇන්තනීට උපදෙස් දෙන්න.

06. යුධ හමුදා කෝප්‍රල් වරයකු ඇතුළු තවත් මගීහු ගණනාවක් අනතුරට පත් වූ යාත්‍රාවක සිර වී එය ගිලී යාමේ අවදානමකට මුහුණ පා සිටිය හ. බේරී යාමට තිබූ මාර්ගය වූ ලණු ඉණිමග, එක් පසෙකට හෝ යාමට නොහැකිව ශීතලෙන් හා බියෙන් ගල් ගැසී සිටි පුද්ගලයකු නිසා අවහිර වී තිබුණි. එම පුද්ගලයා එතැනින් ඉවත් කිරීමට දැරූ නිරර්ථක උත්සාහයන්ගෙන් අනතුරුව ඔහුව ඉණිමගෙන් ඉවතට තල්ලු කර දමන ලෙසට කෝප්‍රල් වරයා අනෙකුත් මගීන්ට අණ කරන ලදී. මගීන් එසේ කරන ලද අතර එම පුද්ගලයා දියට වැටී නොපෙනී ගියේය. ඉන්පසු, සිරවී සිටි මගීන්ට ලණු ඉණිමගෙහි නැගී බේරී යාමට හැකි විය.

මිනී මැරුම සම්බන්ධයෙන් කෝප්‍රල්වරයාට චෝදනා නැගී ඇත.

ඔහුට උපදෙස් දෙන්න.

07. පහත දැක්වෙන අවස්ථාවන් සලකා බලා අරුල්ගේ වගකීම පිළිබඳව නෛතික මතය ලියා දක්වන්න.

(i) කොළඹ පදිංචි අරුල්, එංගලන්තයේ පදිංචිව සිටින සුකුමාර් ගේ නියෝජිතයෙකි. සුකුමාර් විසින් අරුල් වෙත එවනු ලබන සියළුම මුදල් අරුල් විසින් සුකුමාර්ගේ නියමය පරිදි යෙදවිය යුතුය යන ප්‍රකාශිත ගිවිසුමක් සුකුමාර් සහ අරුල් අතර පවතී.

ක්ෂණික ආහාර අලෙවි සැලක් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කොළඹ නගරාසන්නයෙන් මිළදී ගැනීම පිණිස යෙදවීමට නියම කරමින් සුකුමාර් විසින් අරුල් වෙත රුපියල් මිලියන තුනක මුදලක් එවන ලදී. අරුල්, වංක ලෙස එම නියමය පිළි නොපැද එම මුදල තමාගේ ව්‍යාපාරයෙහි ආයෝජනය කරයි.

(ii) 'ගෝල්ඩන් ගේට්' සමාගමෙහි කොටස් තබා ගැනීම සුකුමාර් ගේ වැඩි යහපතට හේතු වේ යැයි විශ්වාස කරමින්, අරුල්, වංක ලෙස නොව සද්භාවයෙන් සුකුමාර්ගේ නියමය පිළිනොපැද ක්ෂණික ආහාර අලෙවි සැලක් සඳහා ගොඩනැගිල්ලක් මිලදී ගැනීම වෙනුවට 'ගෝල්ඩන් ගේට්' සමාගමේ කොටස් සුකුමාර්ගේ නමින් මිලට ගනියි.

08. පහත දැක්වෙන ඕනෑම දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

(i) අපරාධ යුක්තිය පසිඳලීමේ රාජ්‍ය ආයතනයන්හි කාර්ය භාරය

(ii) සාක්ෂි නීතියේ අනුකූලතාවය හා ආවේශ්‍යභාවය යන සංකල්ප

(iii) ස්ත්‍රී දූෂණය නැමැති වරදේ කැමැත්ත යන කරුණ

(iv) අපහරණය නැමැති වරද

හිමිකම් ඇව්රිණි.